www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අතුරුදහන් වූ සසප සාමාජිකයා පිලිබඳ පරීක්ෂනය එක තැන හිර කර ගෙන සිටී

**Sri Lankan Human Rights Commission stalls inquiry into disappeared SEP member**

**අපගේ වාර්තාකරු විසිනි**
**2007 ඔක්තෝබර් 15**

එහි අවසන් විභාග දිනයෙන් තුන් මසකටත් පසුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මාර්තු 22 දා උතුරු ශ්‍රී ලංකාවේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන් හා ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් අතුරුදහන් වීම පිලිබඳ පරීක්ෂනය යලි ඇරඹීමට දිනයක් නියම කර නැත.

පසුගිය බ්‍රහස්පතින්දා සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්ට කතා කරමින්, මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂන නිලධාරි ප්‍රසන්න අරම්පත් "මේවා ප්‍රමාද වන් බව පිලිගත්තත්, සිය පුද්ගලික වැඩ කන්දරාව හැරුන කොට කිසිදු හේතුවක් ඉදිරිපත් නොකලේ ය. ජූලි 6 දායින් පසුව කිසිදු විභාගයක් පවත්වා නැත යන කරුන අවධාරනය කල විට ද අරම්පත් නිශ්චිත දිනයක් නියම නොකල අතර හැකි තරම් ඉක්මනින් එය සිදු කරන බව පමනක් කියා සිටියේ ය.

පසුගිය වසරේ ජනාධිපති මහින්ද රාජපක්ෂ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය යලි ඇරඹීමේ සිට මේ දක්වා පුද්ගලයන් සිය ගනනක්, ආරක්ෂක හමුදාවන්ගේ මැදිහත්වීම වෙත සැකය යොමු කෙරෙන ආකාරයේ අතුරුදහන් කිරීම්වලට හෝ ඝාතනයන්ට ලක් කෙරී ඇත. මෙම සිද්ධීන්ගෙන් අතලොස්සක හැරුනු කොට අන් සියල්ලෙහි ම පාහේ කිසිවකු වරදකරුවකු කරනු තබා කිසිවකුට හෝ චෝදනා ඉදිරිපත් කෙරී නැත.

විමලේස්වරන්ගේ හා මදිවදනන්ගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් කිසිදු බැරෑරුම් පරීක්ෂනයක් පැවැත්වීමට මානව හිමිකම් කොමිෂන් සභාව අසමත් වීම ඔවුන් දෙදෙනා ජීවත් වූ කයිට්ස් දිවයිනේ ඒ සම්බන්ධයෙන් සිදු වන දෙය සමග සමපාත වේ. සිද්ධියට කයිට්ස්හි නාවික හමුදා නිලධාරින්ගේ සම්බන්ධයක් ඇතැයි පෙන්නුම් කරන බලගතු සාක්ෂ්‍ය තිබිය දී පවා. අදාල මූලික ප්‍රශ්නවලට පිලිතුරු දෙන ලෙස වේලනෙයි කන්චදේව නාවික හමුදා කඳවුරේ අන දෙන නිලධාරියාට බල කිරීම පොලීසිය හා ප්‍රාදේශීය උසාවිය ප්‍රතික්ෂේප කර ඇත.

විමලේස්වරන් හා මදිවදනන් අවසන් වරට දකින ලද්දේ මාර්තු 22 දා යාබදව පිහිටි පුංගුඩුතිව් දූපතේ සිට දිවෙන දිග මුහුදු පාලම ඔස්සේ කයිට්ස් දූපතේ වේලනෙයි මාර්ග බාධකය දෙසට යතුරු පැදියකින් ගමන් කරමින් සිටිය දී ය. ඔවුන් දෙදෙනා පුංගුඩුතිව්හි ගමකට ගොස් එදින රාත්‍රියේ පැවැත්වෙන විවාහ මංගල උත්සවයකට සහභාගි වීම සඳහා අවශ්‍ය ඇඳුම් කිහිපයක් රැගෙන ආපසු කයිට්ස් බලා පැමිනෙමින් සිටියහ.

මෙම උතුරු දිවයින් ප්‍රදේශ පුරා ඇඩි මුරකාවල් ලා ගෙන සිටින නාවික හමුදාව මුහුදු පාලම දෙපසේ ම සෝදිසි මුර පොලවල් පවත්වා ගෙන යයි. දෙදෙනා සවස 5.00ට පමන පුංගුඩුතිව් දෙසට යන ගමනේ දී කයිට්ස්හි වේලනෙයි ප්‍රවේශ ස්ථානයේ සිටි බව ද පසුව සවස 6.30ට පමන වේලනෙයි දෙසට ආපසු පැමිනීම පිනිස පුංගුඩුතිව් සෝදිසි මුර පොලේ දී සිය යතුරු පැදිය පන ගන්වමින් සිටි බව ද දැක තිබුනි.

එම වේලාවේ දී යතුරු පැදිය සෝදිසි මුර පොල හරහා ගිය බව පුංගුඩුතිව් නාවික හමුදා කඳවුරේ අන දෙන නිලධාරියා සනාථ කර තිබේ. ඔවුන්ට වෙනත් දෙසකට යාමට හැකියාවක් නොතිබූ තතු තුල දෙදෙනා මද වේලාවකින් වේලනෙයි සෝදිසි මුර පොල වෙත ලඟා විය යුතුව තිබුනි. කෙසේ වෙතත්, ඔවුන් දෙදෙනා පිලිබඳ කිසිවක් නොදන්නා බව කියා සිටින වේලනෙයි නාවික හමුදා කඳවුරේ අන දෙන නිලධාරියා සෝදිසි මුර පොල පිලිබඳ කිසිදු විස්තරයක් සැපයීම ප්‍රතික්ෂේප කර තිබේ.

සසපයේ අවධාරනය මත, මානව හිමිකම් කොමිෂන් සභාව ජූනි 14 දා මෙම අතුරුදහන් වීම පිලිබඳව පරීක්ෂනයක් ආරම්භ කලේ ය. නාවික හමුදාපතිගේ හා පොලිස්පතිගේ නියෝජිතයන් එම විභාගයට පැමින සිටි නමුත් කයිට්ස් හා පුංගුඩුතිව් කඳවුරුවල අන දෙන නිලධාරින් පැමිනියේ වත් කිසිදු නියෝජිතයකු එවා තිබුනේ වත් නැත.

ඊලඟ විභාගය ජුලි 6 දාට දින නියම කර ගැනුනු නමුත් මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂනය භාර නිලධාරි අරම්පත් එදින පැමිනීමට අසමත් විය. සසප ප්‍රධාන ලේකම් ඩයස් ඒ පිලිබඳව විරෝධය පෑමෙන් පසුව මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙනත් නිලධාරියෙක් විභාගය කැඳවී ය. කෙසේ වෙතත්. නාවික හමුදා අන දෙන නිලධාරින් හෝ කයිට්ස් පොලීසියේ නිලධාරින් එදින පැමින නොසිටි අතර එදින විභාගය අවසන් කෙරුනේ අලුත් දිනයක් නියම කර ගැනීමකින් තොරව ය.

අගෝස්තු 15 දා සසප වෙත ලිපියක් එවූ මානව හිමිකම් කොමිෂන් සභාව අතුරුදහන් වීම සම්බන්ධයෙන් සාක්ෂ්‍ය ලෙස දිවුරුම් පෙත්සම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියේ ය. මාර්තු 22 දා වේලනෙයි සෝදිසි මුර පොලේ රාජකාරියේ යෙදී සිටි නාවික හමුදා භටයන්ගේ නම් සහ සසප පැමිනිල්ල පිලිබඳව පරීක්ෂන පවත්වන නාවික හමුදා නිලධාරින්ගේ නම් විමසමින් එවන් ලිපියක් නාවික හමුදාපතිගේ නීති කාර්යාලය වෙත ද යවා තිබුනි.

විමලේස්වරන්ගේ හා මදිවදනන්ගේ බිරින්දෑවරුන්ගෙන් ද ඔවුන් අතුරුදහන් වූ දින විමලේස්වරන් හා මදිවදනන් දැක තිබූ ඇසින් දුටු සාක්ෂ්‍යකරුවන් තිදෙනෙකුගෙන් ද ලබා ගත් දිවුරුම් පෙත්සම් පහක් සසප සැප්තැම්බර් 3 දා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කලේ ය. මානව හිමිකම් කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් මේ වන තුරු සසප වෙත කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නැත.

කයිට්ස් මහේස්ත්‍රාත් උසාවියේ මෙම අතුරුදහන් වීම සම්බන්ධයෙන් පැවැත්වෙන නඩු විභාගයක් ද කිසිඳු ප්‍රගතියක් පෙන්නුම් කර නැත. සැප්තැම්බර් 14 දා පැවති මෑත ම විභාගයේ දී වේලනෙයිහි කන්චදේව නාවික හමුදා කඳවුරේ මහජන සම්බන්ධතා නිලධාරියා පැමින සිටි නමුත් යලිත් වරක් අන දෙන නිලධාරියා උසාවිය ඉදිරියේ පෙනී සිටීම හෝ නියෝජිතයකු එවීම ප්‍රතික්ෂේප කර තිබුනි.

විනිශ්චය ආසනයේ සිටි මහේස්ත්‍රාත්වරයා නඩුවට අවධානය යොමු කලේ යන්තමිනි. මහජන සම්බන්ධතා නිලධාරියාගෙන් කිසිඳු ප්‍රශ්නයක් ඇසුවේ නැත. ඔවුන්ගේ සැමියන් සොයා දෙන බවට සහතිකයක් දීම උසාවියට කල නොහැකි බව පැමිනිලිකාරියන් වන විමලේස්වරන්ගේ හා මදිවදනන්ගේ බිරින්දෑවරුන්ට පැවසූ මහේස්ත්‍රාත්වරයා සාක්ෂ්‍යකරුවන්ගේ නම් සපයන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියේ ය. පැමිනි සිටි පොලිස් නිලධාරියාට හෝ නාවික හමුදා නිලධාරියාට කිසිඳු නියෝගයක් නිකුත් නොකර ම නඩුව ඔක්තෝබර් 19 දා දක්වා කල් තැබීමට ඔහු ඊලඟට ක්‍රියා කලේ ය.

විමලේස්වරන් හා මදිවදනන් පුංගුඩුතිව් වෙත යන ගමනේ දී වේලනෙයි සෝදිසි මුර පොලෙහි සිටි නාවික හමුදා භටයන් ඔවුන් නතර කොට, ශරීර පරීක්ෂාවකට ලක් කොට ඔවුන්ගෙන් ප්‍රශ්න කල බව සහතික කරන ඇසින් දුටු සාක්ෂ්‍යකරුවන්ගේ නම් ඔවුන්ගේ බිරින්දෑවරුන් විසින් මේ වන විටත් සපයනු ලැබ ඇත. වේලනෙයි කඳවුරේ නාවික හමුදා අන දෙන නිලධාරියා වේලෙනෙයිහි සෝදිසි මුර පොලක් පවතින බව තවමත් සහතික කර නැති අතර එනයින් එහි රාජකාරියේ යෙදී සිටින භටයන්ගේ නම් සැපයීම තව දුරටත් ප්‍රතික්ෂේප කරමින් සිටී.

පසුගිය මාසය තුල, උතුරේ යාපන අර්ධද්වීපයේ පමනක් අඩු ගනනේ 24 දෙනෙක් "අතුරුදහන්" වී තිබේ. එම කාල පරිච්ජේදය තුල දී ම, පැහැර ගැනීමට හෝ ඝාතනයට ලක් වෙතැයි බියෙන්, ලමුන් සහිත පවුල් හතරක් ඇතුලු සිවිල් වැසියන් 72ක් යාපන නගරයේ මානව හිමිකම් කොමිෂන් සභා ශාඛාව වෙතින් ආරක්ෂාව ඉල්ලා ඇත. මහේස්ත්‍රාත් උසාවියක් ඉදිරියට පමුනුවනු ලැබුව හොත් "ආරක්ෂාව" සඳහා රක්ෂිත බන්ධනාගාරය වෙත යැවීමේ ඉරනමට ඔවුහු මුහුන දෙති.

ඔක්තෝබර් 11 දා, යාපනයට උතුරෙන් පිහිටි පේදුරුතුඩුවේ නීතිඥයෝ බිය ගැන්වීම, කප්පම් ගැනීම හා මරනීය තර්ජන එල්ල කිරීම සම්බන්ධයෙන් හමුදාවට හා එය සමග සම්බන්ධිත පැරා-මිලිටරි කන්ඩායම්වලට චෝදනා කරමින් විරෝධතාවක් පැවැත්වූහ. යාපන අර්ධද්වීපයේ නීතිඥ සංගමය විසින් සංවිධානය කරන ලද එවන් විරෝධතාවක් සැප්තැම්බර් 19 දා පැවැත්වුනි. ආරක්ෂාව සපයන බවට යාපනයේ මිලිටරි අන දෙන නිලධාරියා පොරොන්දු වී තිබුනත් තර්ජන තවම නතර වී නැත.

මානව හිමිකම් බැරෑරුම් ලෙස උල්ලංඝනය වී ඇති සිද්ධීන් පිලිබඳව පරීක්ෂන පැවැත්වීමට පත් කර ඇති ජනාධිපති පරීක්ෂන කොමිෂම කිසිද සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වා නැතැයි කීර්තිමත් පුද්ගලයන්ගේ ජාත්‍යන්තර ස්වාධීන කන්ඩායම (අයිඅයිජීඊපී) සැප්තැම්බර් 18 දා සඳහන් කලේ ය. මේ වසරේ මුල ජනාධිපති රාජපක්ෂ අයිඅයිජීඊපී පත් කලේ ශ්‍රී ලංකාවේ පුලුල්ව පැතිරුනු මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් වැඩෙන ජාත්‍යන්තර විවේචන පාලනය කර ගැනීමේ උත්සාහයක් ලෙස ය. අයිඅයිජීඊපී උත්සුකතාවන්ට අවධානය යොමු කරනවා වෙනුවට, ආන්ඩුව හා නීතිපති කර ඇත්තේ, ප්‍රසිද්ධ ප්‍රකාශ කිරීම නතර කරන ලෙස එම මන්ඩලයෙන් වහාම ඉල්ලා සිටීම යි.

සෙනසුරාදා කොලඹට කල සංචාරයක දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් ලුයිස් ආබර් මෙසේ ප්‍රකාශ කලා යඃ "නීතියේ පාලනය දුර්වල වීම සහ මුක්තිය සෑම තන්හිම බල පැවැත්වීම අනතුරු අඟවන සුලු ය. වාර්තා වී ඇති ඝාතන, පැහැර ගැනීම් හා අතුරුදහන්වීම්වලින් විශාල සංඛ්‍යාවක් තවමත් නොවිසඳී පවතී." එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂම ශ්‍රී ලංකාවට නිරීක්ෂකයන් එවීම හෝ එහි කාර්යාලයක් පිහිටුවීම කල යුතු ය යන ආබර්ගේ යෝජනාව ආන්ඩුව වහාම ප්‍රතික්ෂේප කලේ ය.

විමලේස්වරන් හා මදිවදනන් සොයා ගැනීමත් ඔවුන් නිරුපද්‍රිතව නිදහස් කිරීම සහතික කර ගැනීමත් පිනිස වහාම පරීක්ෂනයක් පවත්වන ලෙස ශ්‍රී ලංකා බලධාරින්ගෙන් ඉල්ලා සිටින ලෙස සසප ආධාරකරුවන් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයන් වෙත අපි නැවතත් කැඳවුම් කර සිටිමු.

ලිපි යැවිය යුත්තේඃ

ගෝඨාභය රාජපක්ෂ,
ආරක්ෂක ලේකම්,
15/5, බාලදක්ෂ මාවත,
කොලඹ 3, ශ්‍රී ලංකාව.
ෆැක්ස්ඃ 0094-11-2541529.
ඊ-මේල්ඃ secretary@defence.lk

එන්.ජී. පුංචිහේවා,
අධ්‍යක්ෂ-පැමිනිලි හා පරීක්ෂන,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂම,
අංක 36, කින්සි පාර,
කොලඹ 8, ශ්‍රී ලංකාව,
ෆැක්ස්ඃ 0094-11-2694924.

ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත එවිය යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ. 1270,
කොලඹ. ශ්‍රී ලංකාව,
ඊ-මේල්ඃ wswscmb@sltnet.lk

* * *

*පහත පල වන්නේ ලැබී ඇති ලිපිවලින් තෝරාගත් කොටසකිඃ*

සැප්තැම්බර් 13 දා කොලඹ දී පවත්වන ලද මහ බැංකු සේවක සංගමයේ (ශ්‍රී ලංකාවේ) වාර්ෂික මහා සභා රැස්වීම පහත යෝජනාව සම්මත කලේ යඃ

" පසුගිය මාර්තු 22 දින යාපන අර්ධද්වීපයේ කයිට්ස් ප්‍රදේශයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන් සහ ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් අතුරුදන් වීම පිලිබඳව පූර්න වාර්තාවක් සැපයීමට ශ්‍රී ලංකාවේ ආන්ඩුව ක්‍රියා කල යුතු යයි මහ බැංකු සේවක සංගමයේ මෙම වාර්ෂික මහා සභාව තරයේ කියා සිටී.

" නාවික හමුදාව විසින් දෙකොනෙහි මාර්ග බාධක පවත්වා ගෙන යමින් ද ඒවා අතර නිරන්තර මුර සංචාරයන් පවත්වා ගනිමින් ද රැකවල් කරනු ලබන පුංගුඩුතිව් දූපත සහ කයිට්ස් දූපත යා කෙරෙන මුහුදු වේල්ලට ප්‍රවිෂ්ට වීමෙන් පසු මොවුන් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මිලිටරිය ඍජුව ම වග කිව යුතු ය, නැතහොත් සම්බන්ධ ය. මේ පිලිබඳව සැලකිය යුතු සාක්ෂ්‍ය සමාජවාදී සමානතා පක්ෂය විසින් සොයා ගනු ලැබ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පල කරනු ලැබ ඇත.

" මොවුන් දෙදෙනා අතුරුදන් වී මාස පහක් ගතවී ඇතත් ආන්ඩුව හෝ මානව හිමිකම් කොමිසම ඒ සම්බන්ධයෙන් මේ දක්වා යථා පරීක්ෂනයක් පවත්වා නැත.

" විමලේස්වරන් සහ මදිවදනන්ගේ අතුරුදහන් වීම සම්බන්ධව ආන්ඩුව වග කිව යුතු යයි කියා සිටින මෙම වාර්ෂික මහා සභාව ඔවුන්ව වහාම නිරුපද්‍රිතව නිදහස් කල යුතු යයි ආන්ඩුවට කියා සිටී.

" සසප ආධාරකරුවකු වූ සිවප්‍රගාසන් මරියදාස් පසුගිය වසරේ අගෝස්තු 7 වෙනි දා නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල දිස්ත්‍රිකකයේ මුල්ලිපොතනේ පිහිටි ඔහුගේ ම නිවසේ දී ඝාතනය කිරීම ගැන විධිමත් හා බැරෑරුම් පරීක්ෂනයක් පැවැත්වීමට ආන්ඩුව හා අදාල බලධාරීහු මේ දක්වා අසමත්ව සිටිති.

" ඝාතනයෙන් පසුව මරියදාස් එල්ටීටීඊයේ සාමාජිකයෙක් යයි සාවද්‍ය කටකතා පැතිරවූ මිලිටරිය හා එය සමග සම්බන්ධ පැරා මිලිටරි කන්ඩායම් මෙම ඝාතනයට වගකිවයුතු බවට අඟවන්නා වූ සාධාරන හේතු පවතී.

" වසරකට ආසන්න කාලයක් ගතවී ඇතත් මෙම අපරාධය සම්බන්ධව කිසිවෙකු අත්අඩංගුවට ගැනීමට හෝ චෝදනා ඉදිරිපත් කිරීමට පොලීසිය අසමත් වීම ම මෙම කරුන බලගතු ලෙස සනාථ කරයි.

" මෙම අතුරුදන් කිරීම් සහ ඝාතනය වනාහී යුද්ධයට දැක්වූ විරුද්ධත්වයත් සෑම ආකාරයකම වර්ගවාදී දේශපාලනයට එරෙහිවත් සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීමට ගෙන ගිය අරගලයත් නිසා සමාජවාදී සමානතා පක්ෂයට සහ මෙම පුද්ගලයන්ට එරෙහිව කරන ලද දේශපාලන අපරාධ යයි මෙම වාර්ෂික මහා සභාව හෙලා දකී."

෴ ෴ ෴

මහත්මයානනි,

නඩරාජා විමලේස්වරන් හා සිවනාදන් මදිවදනන් අතුරුදහන් වීම සම්බන්ධිත කොන්දේසි පිලිබඳ පූර්න පරීක්ෂනයක් වැලැක්වීමට ශ්‍රී ලංකාවේ බලධාරීන් හා මිලිටරිය දරන මෑතම විවෘත ප්‍රයත්නයන් පිලිබඳ මාගේ විරෝධය පල කිරීමට කැමැත්තෙමි. විමලේස්වරන් හා මදිවදනන් අවසන් වරට දකින ලද්දේ මාර්තු 22 දා කයිට්ස් දිවයිනේ පිහිටි මාර්ග බාධකයක් දෙසට යතුරු පැදියකින් යමින් සිටිය දී ය. යාබද පුංගුඩුතිව් දිවයිනේ සිට මුහුදු පාලමක් ඔස්සේ ඔවුහු ගමන් කරමින් සිටියහ. අදාල දිනයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාව මුහුදු පාලමේ දෙකෙලවර ම මාර්ග බාධක පවත්වා ගෙන ගියේ ය. එය වනාහි සාක්ෂ්‍යකරුවන් ඕනෑම සංඛ්‍යාවක් විසින් සනාථ කරනු හැකි කාරනාවකි. එහෙත් අගෝස්තු 3 දා කයිට්ස් දිවයිනේ මහේස්ත්‍රාත් උසාවියේ දී පොලීසිය ඉදිරිපත් කල කන්වදේව නාවික හමුදා කඳවුරේ අන දෙන නිලධාරියාගේ ලිපියක් මගින් එවන් මාර්ග බාධකයක් පවත්වා ගෙන යන බව ප්‍රතික්ෂේප කර තිබුනි. මෙම අනතුරු අඟවන බොරුව මුලුමනින් ම සේවය කරන්නේ, සාමාන්‍ය ශ්‍රී ලංකා පුරවැසියන්ට එරෙහිව යලිත් වරක් කැත යුද්ධයක් දියත් කරනු ලැබ ඇති කොන්දේසි යටතේ, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ ක්‍රියාකාරකම් පරීක්ෂාවට ලක් කිරීමෙන් ආවරනය කර ගැනීමට යි. විමලේස්වරන්ට හා මදිවදනන්ට කුමක් සිදු වුනි ද යන්න සොයා බැලීම සඳහා අවධාරනාත්මකව යොමු කෙරුනු පරීක්ෂනයක් වහාම දියත් කරන ලෙස මම ඉල්ලා සිටිමි.

මෙයට,
එස්.ජේ.
එක්සත් රාජධානිය.

© www.wsws.org